# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.10.23 පැය 2315 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1933/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## සංවිධානාත්මක අපරාධකරුවෙකුට අයත් අධි සුඛෝපභෝගී බස් රථ දෙකක් පොලිස් භාරයට ගැනීම - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.

රැදවුම් නියෝග මත බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය මගින් විමර්ශන සිදු කරනු ලබන සංවිධානාත්මක අපරාධකරුවෙකු වන නැදුන්ගොඩගේ නිර්මල ප්‍රසංග නොහොත් බැකෝ සමන් යන සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත 2025.10.23 වන අද දින පිටකොටුව හා ආඩිඅම්බලම ප්‍රදේශවලදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් අධි සුඛෝපභෝගී බස් රථ දෙකක් පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් මුදල් මගින් මෙම බස් රථ මිලදී ගෙන වෙනත් තැනැත්තන්ගේ නමින් ලියාපදිංචිකර අධිවේගී මාර්ගයේ කොළඹ මොණරාගල ධාවනය සඳහා සහ සංචාරක ව්‍යාපාර කටයුතු සඳහා යොදාවා තිබී ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

බස් රථ දෙකෙහි ඡායාරූප මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**